# ආයෝජන ආදායම් මත තක්සේරු වන ආදායම

තුෂාර ඉංදික ජයවීර

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# ආයෝජන ආදායම් මත තක්සේරු වන ආදායම

# (Assessable Income on Investment Income)

## 7 වන වගන්තිය

තැනැත්තෙකු විසින් තක්සේරු වසරක් තුලදී ආයෝජන මත තමන්ට ලැබෙන ලැබීම් සහ ලාභ එම වර්ෂය සඳහා ඔහුගේ ආයෝජන ආදායමකි. ආයෝජන ආදායම් හඳුනා ගැනීමේදී මුදල් පදනම සාමාන්‍යයෙන් භාවිතා කරයි.

මෙම වගන්තිය තුල තැනැත්තෙකුට උද්ගත වන පහත ලැබීම් ආයෝජන ආදායම් ලෙස දක්වා ඇත.

1. ලාභාංශ, පොලී, වට්ටම්, අය කිරීම්, වාර්ෂික, ස්වාභාවික සම්පත් ගෙවුම්, කුලී, අධි මිල සහ රාජ්‍ය භාග
2. ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලාබ
3. ආයෝජනයක් සීමා කිරීම / භාර ගැනීමක් වෙනුවෙන් ලද මුදල්
4. ආයෝජන මත එම තැනැත්තාට ලැබෙන ත්‍යාග
5. ලොතරැයි, ඔට්ටු ඇල්ලීම හෝ සුදු ක්‍රීඩාවෙන් දිනුම් ලැබීම්
6. මෙම පනත තුල සඳහන් වෙනත් මුදලක්

නමුත් මෙම ආයෝජන සඳහා පහත ආදායම් ඇතුලත් නොවේ.

- සේවා නියුක්ති ආදායම
- නිදහස් ආයෝජන ආදායම්
- අවසාන රඳවා ගත් බදු ගෙවූ ආදායම්
- ව්‍යාපාර ආදායම්

ආයෝජන ආදායම් පිළිබඳ සැලකීමේදී එක් එක් ආයෝජන ආදායම් මත සිදු කළ යුතු බදු ගැලපීම් පහත වේ.

### (01.)

### 1. ලාභාංශ ආදායම - (Dividend Income)

සමාගමක් විසින් ලාභ කොටස් හිමියන්ට බෙදා හැරීම මත ලාභාංශ ඇති වේ. එම ලාභාංශ මත සාමාන්‍යයෙන් සමාගම විසින් රඳවා ගැනීමේ බද්දක් අය කරනු ලබයි. එමනිසා ලාභාංශ හිමියා විසින් පහත ආකාරයෙන් ලාභාංශ ගණනය කිරීම සිදු කළ යුතු වේ.

| විස්තරය | ශුද්ධ ලාභාංශය | රඳවා ගත් බදු (බද්ද) | දළ ලාභාංශය |
|---|---|---|---|
| | 86% | 14% | 100% |
| උදාහරණ | 860 | 140 | 1,000 |

මෙලෙස රඳවා ගත් බදු අඩු කළ පසු එම ලාභාංශ නැවත බද්දට යටත් නොවේ. එම අඩු කළ රඳවා ගත් බද්ද අවසාන බද්දකි. :ඍසඹික අසඑයයදකාසඛට ඒහපැබඑ*

### බදු නිදහස් ලාභාංශ ආදායම්

- වෙනත් සමාගමකින් ලද ලාභාංශ මඟින් ගෙවන ලාභාංශ
- වෙනත් සමාගමක් ලද ලාභාංශ සහ එම වෙනත් සමාගම ලාභාංශ මත රඳවා ගැනීමේ බදු අඩු කර ඇති විට.

JMC vLearning
your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## 2. පොලී ආදායම - (Interest Income)

තැනැත්තෙකුගේ මුදල් ආයෝජන, තැන්පතු, ණයට දීම වැනි ක්‍රියා මාර්ග නිසා පොලී ආදායම් උද්ගත වේ. එම පොලී ආදායම මත දළ පොලිය ආදායම බදු සඳහා හඳුනාගත යුතුය.

බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු හිමියන්ට පොලී ගෙවන විට 5% රඳවා ගැනීම් බද්දක් අය කරනු ලබයි.

එම නිසා පොලී ආයම් හිමි තැනැත්තා තමාගේ පොලී ආදායම පහත පරිදි ගණනය කරයි.

| විස්තරය | ශුද්ධ පොලිය / ලද පොලිය | රඳවාගත් බද්ද 5% | දළ පොලිය |
|---|---|---|---|
| | 95% | 5% | 100% |
| | 9,500 | 500 | 10,000 |

- මෙම අඩු කළ බද්ද තනි පුද්ගලයකු වන විට අවසාන බද්දකි. එවිට එම පොලී නැවත බද්දට යටත් නොවේ.
- සමාගමක් හෝ ඒකකයක් වන විට මෙම අඩු කල රඳවාගත් බද්ද බදු බැරක් වන අතර එමනිසා දල පොලිය බද්දට යටත් වේ.

### බදු නිදහස් පොලී ආදායම්

1. මහ බැංකුව නිකුත් කල ~දඩැරුසටබ ඊදඞ්* ස්වෛරී බැදුම්කර මත අනේවාසිකයින්ට ගෙවූ පොලී, බැංකුවක් විසින් තවත් බැංකුවකට ගෙවූ පොලී.
2. පුණ්‍ය ආයතනයක් ලද පොලී ආදායම් එම පොලී අවශ්‍ය තැනැත්තන්ට ආයතනිකමය රැකවරණය සපයන බවට දේශීය ආදායම් කොමසාරිස්වරයා සෑහීමකට පත්වන බව.
3. වාසිකයෙකු වන ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුට මූල්‍ය ආයතන මත උද්ගතවන වර්ෂයකට රු. 1,500,000 දක්වා සහනය (වගන්ති 52 මත සහනය).

## 3. කුලී ආදායම - (Rent Income)

- තැනැත්තෙකු තමන්ගේ දේපල කුලියට දීමෙන් මෙම ආදායම උද්ගත වේ.
- එම කුලියට දීම තවත් සාමාන්‍ය පුද්ගලයෙකුට දී ඇති විට දළ කුලිය ඔහුගේ ආදායම වේ.
- එම කුලියට දීම රඳවාගත් නියෝජිතයෙකුට දී ඇති විට (ව්‍යාපාරික) ඔවුන් විසින් කුලිය මත 10% රඳවාගත් බද්දක් අය කර ශුද්ධ කුලිය අයිතිකරුට ලබා දේ. එවිට පහත ආකාරයට දළ කුලිය සොයාගත යුතුය.

| විස්තරය | ශුද්ධ පොලිය / ලද පොලිය | රඳවාගත් බද්ද 5% | දළ පොලිය |
|---|---|---|---|
| | 90% | 10% | 100% |
| | 900,000 | 100,000 | 1,000,000 |

මෙම දළ කුලිය බද්දට යටත් වන අතර, රඳවා ගත් බදු ගෙවා ඇත්නම් එම රඳවා ගත් බද්ද බදු බැරක් වේ.

- කුලී ආදායම් ගණනයේදී එකී දේපල කුලිය දීමට අදාල වියදම් අඩු කල හැකි වේ.
- තනි පුද්ගලයින් සඳහා අළුත් වැඩියා සහ ක්ෂය වියදම් සඳහා පනතේ 52 වගන්තිය මත 25% සුදුසුකම් සහනයක් කුලී තක්සේරු ආදායම මත ලබා ගැනීමෙන් හෝ සත්‍ය වියදම් ඊට වැඩි නම් සත්‍ය වියදම අදාල පරිදි අඩු කර ගැනීම සිදු කළ යුතුය. (එකවිට මෙම දෙවර්ගයම අඩු කළ නොහැකි බව මතක තබාගත යුතුයි)


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

4. අනිකුත් ආයෝජන ආදායම් මත රාජ්‍ය භාග වැනි ආදායම් මතද රඳවාගත් බදු අඩු කර ඇත්නම් දළ ආදායම බද්ද යටත් වන අතර අදාල රඳවා ගැනීමේ බද්ද බදු බැරක් ලෙස ලබාගත හැකිය.

5. මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වෙන්දේසි විකිණීමෙන් වන 2.5% රඳවා ගැනීමේ බද්දක් අය කරන අතර එකී ලැබීමක් නැවත බද්දට යටත් නොවේ. එම අඩු කල බද්ද අවසාන බද්දකි.

## (02.) ආයෝජන වත්කම් උපලබ්ධි කිරීම මත ආදායම් ගණනය

ආයෝජන වක්කමින් උපලබ්ධි කල විට එහි ලාභය/අලාභය පහත පරිදි තක්සේරු කල යුතුය.

| 2017/09/30 ට පෙර අත්පත් කරගත් වත්කම් | | | 2017/09/30 ට පසු අත්පත් කරගත් වත්කම් | | |
|---|---|---|---|---|---|
| විකුණුම් ප්‍රතිශ්ඨාව | | xxx | විකුණුම් ප්‍රතිශ්ඨාව | | xxx |
| (-) | | | (-) | | |
| පිරිවැය | | | | | |
| 2017/09/30 දිනට | | | සත්‍ය පිරිවැය | xx | |
| වෙළඳපොල වටිනාකම | xxx | | විකිණීම සඳහා දැරූ වියදම් | xx | (xx) |
| පසුව විකිණීම සඳහා දැරූ වියදම් | xxx | (xxx) | | | |
| ලාභය හෝ අලාභය | | xxx | ලාභය හෝ අලාභය | | xxx |

මෙම ගණනය කළ ලාභය මත 10% ක බද්දක් ගෙවීම සහ එසේ උපලබ්ධියෙන් දින 30 ඇතුලත අදාළ බදු වාර්තාවද සහිතව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල යුතුය.

### බදු නිදහස් ආයෝජන වත්කම් උපලබ්ධි ලාභ

1. මිල ලැයිස්තු ගත සමාගම් කොටස් විකිණීමේ ලාභ
2. එක් අයෝජන වත්කමක් මත උපලබ්ධි ලාභය රු. 50,000 නොඉක්මන විට හෝ වර්ෂයට රු. 600,000 නොඉක්මවන (තනිව හෝ හවුලේ ගත් කළ)
3. බද්ධ වත්කමක උපලබ්ධි ලාභයද ඉහත 2 වන කරුණට සමාන වේ.
4. වාසික තැනැත්තෙකු තමාගේ ප්‍රධාන නිවස උපලබ්ධියෙන් ඇතිවන ලාභ පහත කොන්දේසි සම්පූර්ණ වීම මත
   - වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් අයිතව සිටීම සහ
   - එම නිවසේ අවම වශයෙන් වසර දෙකක් එම තැනැත්තා පදිංචි වී සිටීම මත එකී ලාභ බදු නිදහස වේ.

## (03.) සුදු, ඔට්ටු හෝ ලොතරැයි දිනුම් ලැබීමේ ආදායම්

මෙම ආදායම් ලැබීමේදී පහත නියමයන් අදාල වේ.

- රු. 500,000 දක්වා එවැනි දිනුමක් ආදායම් බද්දෙන් නිදහස් වීම
- රු. 500,000 වැඩි දිනුම් 14% රඳවා ගැනීමේ බද්දට යටත්ව ලැබේ.
- එලෙස අඩු කළ රඳවාගත් බද්ද අවසාන බද්දකි.
- එලෙස රඳවා ගත් බදු අඩු කර ඇති විට එම දිණුම් ආදායම නැවත බද්දට යටත් නොවේ.

JMC vLearning
"your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd